# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## මුද්දර ගාස්තු

## මුද්දර ගාස්තු සමථයකට පත්කිරීමේ බලයලත් තැනැත්තන් විසින් මුද්දර ගාස්තු ගෙවීම

## සමථයකට පත් කරන ලද මුද්දර ගාස්තු පිළිබ| ප්‍රකාශය ඉදිරිපත් කිරීම සහ මුද්දර ගාස්තු ප්‍රේෂණය කිරීම

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 7 වන වගන්තිය යටතේ;

(අ) රක්ෂණ ඔප්පු නිකුත් කරනු ලබන යම් තැනැත්තෙකු;

(ආ) පුද්ගලයන් සියයකට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති, සේවකයන් සඳහා කරන ලද ගෙවීම් වෙනුවෙන් ලදුපත් භාරගනු ලබන යම් සේවා යෝජකයෙකු;

(ඇ) බලපත්‍ර නිකුත් කරන යම් අධිකාරියක්;

(ඈ) ණය කාඩ්පත් පහසුකම් සලසන යම් සේවා සපයන්නෙකු;

(ඉ) අවස්ථානුකූලව එසේ කිරීමට බැදෙන යම් වෙනත් තැනැත්තෙකු;

පිළිවෙලින් රක්ෂණ ඔප්පු, ලදුපත්, හිමිකම් බලපත්‍ර හෝ යම් වෙනත් සාධන පත්‍ර සම්බන්ධයෙන් මුද්දර ගාස්තු මුදල සමථයකට පත්කිරීම සහ සෑම වසරකම මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන අදාළ කාර්තු අවසන් වී දින පහළොවක් ඇතුළත එම මුදල කාර්තුමය වශයෙන් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීම කළ යුතුය.

**(2019 ජනවාරි 15 වන දින නිවාඩු දිනයක් බැවින්, 2019 ජනවාරි මස 14 වන දින හෝ ඊට පෙර ගෙවීම් කිරීමට කටයුතු යොදන මෙන් කාරුණිකව දන්වමි.)**

**(ඉහත; (අ) සිට (ඉ) දක්වා සඳහන් කාර්යයන් අතුරින් එක් කාර්යයක් හෝ ඉටු කරන තැනැත්තකු මෙතෙක් ලියාපදිංචි වී නැතිනම් ලියාපදිංචි වී මුද්දර ගාස්තු ගෙවිය යුතුය.)**

ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ අංක **4153842** දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ මුද්දර ගාස්තු ගිණුමට සමථයකට පත්කරන ලද මුද්දර ගාස්තු ගෙවිය යුතු අතර, ප්‍රේෂණ පත්‍රිකාවේ තුන්වන පිටපත, සමථයකට පත් කරන ලද මුද්දර ගාස්තු ප්‍රකාශනයේ දෙපාර්තමේන්තු පිටපත් [1 හා 2] වලට අමුණා එවිය යුතුය. එකී ප්‍රකාශනයේ බදු ගෙවන්නාගේ පිටපත ලිපි ගොනුවේ තබාගත යුතුය. (මේ සම්බන්ධයෙන් චෙක්පත් මුද්දර ගාස්තු අංශය වෙත සෘජුවම නොඑවන ලෙස කරුණාවෙන් දන්වමි.)

අදාලවන අනුප්‍රමාණයන් දක්වන සටහන සහ ප්‍රකාශනය පිරවීම හා ඉදිරිපත් කිරීම සඳහා වන උපදෙස් මාලාව, සහ රාජ්‍ය ආයතන ප්‍රධානීන් අමතන ලද චක්‍රලේඛය - **www.ird.gov.lk** වෙබ් අඩවියෙන් ලබාගත හැක.

**වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානයේ 1944 අංකයට අමතන්න.**

දේශීය ආදායම් වෙබ් අඩවිය – www.ird.gov.lk

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

*බදු - වඩා හොඳ අනාගතයකට*